කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**නිවේදන අංකය : 01** WWL /20/12/27/01

**වර්ණය :** ඇම්බර්

## තද වැසි පිළිබඳ අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
**2020 දෙසැම්බර් මස 28 වන දින පෙ.ව. 07.00 වන තෙක් වලංගු වන පරිදි**
**2020 දෙසැම්බර් මස 27 වන දින පෙ.ව. 07.00 ට නිකුත් කරන ලදී.**

### ගොඩබිම් ප්‍රදේශ සඳහා




**සැලකිලිමත් වන්න!**

**දිවයින ආශ්‍රිත පහළ වායුගෝලයේ පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන් දිවයිනේ බොහෝ ප්‍රදේශවල වල වැසි සහිත කාලගුණ තත්වයක් පවතිනු ඇතැයි බලාපොරොත්තුවේ.**

**උතුරු, නැගෙනහිර, උතුරු-මැද, ඌව, මධ්‍යම සහ වයඹ පළාත්වල විටින් විට වැසි ඇතිවන අතර ඇතැම් ස්ථානවලට මි.මී. 100 ට වැඩි තද වැසි ද ඇතිවිය හැක.**

**සෙසු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවන අතර මෙම ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට මි.මී. 75 ට වැඩි තරමක තද වැසි විශේෂයෙන්ම සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ ඇතිවිය හැක.**

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**